# 1970 දශකයේ ආරම්භ වූ ද්‍රවිඩ තරුණ නැගිටීම් කෙරෙහි සමකාලීන අධ්‍යාපන ප්‍රතිපත්ති තුළින් එල්ල වූ බලපෑම් පිළිබඳ අධ්‍යයනයක්

ලක්මිණි ගමගේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.

## පසුබිම හා හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ තරුණ නැගිටීම් පිළිබඳ සලකා බැලීමේදී 1970 දශකයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මීට පෙරත් ද්‍රවිඩ ජාතික නායකයින් හා සිංහල ජාතික නායකයින් අතර යම් යම් කාරනාවන් පදනම් කරගෙන භේදකාරී තත්ත්වයන් ඇති වී තිබුණත් ද්‍රවිඩ ප්‍රජාව මෙතෙක් කල් සටන්කාමී අයුරින් පෙරට ඒමේ ප්‍රවණතාවයක් දක්නට නොලැබිණි. නමුත් හැත්තෑව දශකයේදී මේ සම්බන්ධව පැහැදිලි වෙනස්කම් දෘෂ්‍යමාන විය.

1970 දී කැපී පෙනෙන මැතිවරණ ජයග්‍රහණයක් ලබා ගනිමින් සමඟි පෙරමුණු ආණ්ඩුව ලංකාවේ බලයට පත් විය. සමඟි පෙරමුණු ආණ්ඩුව බලයට පත්වන විටත් රටේ ප්‍රබල ආර්ථික අර්බුදයක් දක්නට ලැබුණි. ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදීම පවා රජයට අපහසු විය. ඒ අයුරින්ම සේවා වියුක්ති ප්‍රශ්නය පදනම් කරගෙන තරුණ ප්‍රජාව පීඩාවට පත්ව සිටියේ ය. සිංහල තරුණයන් අතර පැවති මෙම පීඩාකාරී වාතාවරණය 1971 දී රාජ්‍ය විරෝධි කැරැල්ලක් වශයෙන් ඔවුන් පිට කළේ ය. මෙරට රැකියා ක්ෂේත්‍රයේ නියෝජනයන් පිළිබඳ සලකා බැලීමේදී ජනගහන අනුපාතයට සාපේක්ෂව වරප්‍රසාදිත රැකියාවල ද්‍රවිඩ නියෝජනය යටත් විජිත අවධියේ සිටම මේ වෙනස දක්නට ලැබුණි. සිංහලයන්ට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ඒ අවධියේ රටේ වරප්‍රසාදිත රැකියාවකට අවතීර්ණ වීම සඳහා ඉංග්‍රීසි දැනුම අත්‍යවශ්‍ය විය. සිංහලයින්ට සාපේක්ෂව ද්‍රවිඩයන්ගේ ඉංග්‍රීසි දැනුම ඉහළ මට්ටමක පැවතුණි. යටත් විජිත අවධියේ පටන්ම අධිරාජ්‍ය පාලකයින්ගේ විශේෂ ප්‍රසාදයට පාත්‍ර වූ ද්‍රවිඩයන්ට රජය මගින් සහ ක්‍රිස්තියානි මිෂනාරින්ගේ මූලිකත්වයෙන් දියුණු පාසල් පද්ධතියක් යාපනය ප්‍රදේශයේ පිහිටුවා දී තිබුණි. ඒ නිසා ඔවුන්ගේ අධ්‍යාපනික හැකියාව ඉහළ තලයක පිහිටා තිබුණි. ද්‍රවිඩයන් අතරිනුත් කුලීන ද්‍රවිඩයන්ගේ අධ්‍යාපන සහභාගීත්වය ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර නිදහස ලැබීමෙන් පසු සිංහල ප්‍රදේශවලත් සීඝ්‍රයෙන් අධ්‍යාපනික ඉඩ ප්‍රස්ථා පුළුල් වන්නට විය. නිදහස් අධ්‍යාපනයේ ව්‍යාප්තියත් පාසල් සහ විශ්වවිද්‍යාල අලුතින් ගොඩනැගීමත් ස්වභාෂා අධ්‍යාපනය ව්‍යාප්ත වීමත් එහිදී වෙසෙසින් කැපී පෙනුණි. මේ නිසා සිංහල තරුණ තරුණියන්ට පෙරට වඩා විශ්වවිද්‍යාලවලට ඇතුල්වීමේ ඉඩකඩ විවර විය. නමුත් හැත්තෑව දශකය ආරම්භ වන විටත් වරප්‍රසාදිත රැකියාවන් සඳහා අවතීර්ණ විය හැකි විද්‍යා පීඨ තුළට සිංහලයින්ගේ නියෝජනය දක්නට ලැබුනේ සුළු වශයෙනි. ඔවුන් බහුතරය ඒකරාශී වී සිටියේ කලා පීඨ තුළයි. ඊට මූලික වශයෙන් බලපෑවේ වරප්‍රසාදිත පීඨ තුළ ඇතුළුවීමට තවදුරටත් ඉංග්‍රීසි දැනුම අවශ්‍යව තිබීමයි. ද්‍රවිඩයින් සතුව පැවති ඉංග්‍රීසි දැනීමත්, දියුණු පාසල් පද්ධතියත් නිසා මේ වන විටත් විද්‍යාපීඨ තුළ ඔවුන්ගේ නියෝජනය ජන අනුපාතයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. මේ පසුබිමේ එතෙක් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ අවතක්සේරුවට ලක්ව ඇති මහ ජාතිය වූ සිංහලයින්ටත්

සාධාරණයක් ඉටුකිරීමේ බලාපොරොත්තුවෙන් සමඟ පෙරමුණු රජය අධ්‍යාපනික ප්‍රමිතිකරණ ප්‍රතිපත්තියක් (Satadardization Policy) හා දිස්ත්‍රික් පදනම (District Quota System) මත විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයින් තෝරාගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබීය. නමුත් මෙම ප්‍රතිපත්තීන් ද්‍රවිඩ ප්‍රජාවගේ බලවත් විවේචනයන්ට හේතු විය. මේ ප්‍රතිපත්ති හරහා තමන්ගේ අධ්‍යාපනික හා රැකියා ඉඩප්‍රස්ථාවලට පහර වදින බව ඔවුහු අවධාරණය කළෝ ය. ඔවුන් තවදුරටත් එකී ක්ෂේත්‍රවල ඔවුන් මෙතෙක් භුක්තිවිඳි සුවිශේෂ වරප්‍රසාදිත තත්ත්වය බලාපොරොත්තු විය. ද්‍රවිඩ තරුණයන් කල්පනා කළේ මේ ප්‍රතිපත්ති හරහා සිංහල රජය තමන්ව අවතක්සේරුවට ලක්කර ඇති බවයි. මේ පසුබිමේ ඔවුන් රහසිගතව සංවිධානය වෙමින් තමන්ට අනන්‍ය වූ වෙනම ද්‍රවිඩ ඊළමක් වෙනුවෙන් හඬනගන්නට විය.

## පර්යේෂණ ගැටලු

මෙම පර්යේෂණය තුළින් මූලික ගැටලු කීපයකට විසඳුම් සෙවීමට බලාපොරොත්තු වේ.

01. 70 දශකය වන විට විවිධ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සඳහා සමඟි පෙරමුණු රජය යොමුකළ සමාජ, දේශපාලන හා ආර්ථික සන්දර්භය කුමක් ද?

02. රජය හඳුන්වා දුන් මෙම ප්‍රතිසංස්කරණ, ද්‍රවිඩ පාර්ශවය පැත්තෙන් කොතෙක්දුරට සාධාරණ වේද?

03. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීම තුළින් ද්‍රවිඩ සමාජයේ ඇති වූ සුවිශේෂ වෙනස්කම් මොනවාද?

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණය තුළින් 70 දශකය ආරම්භයේ සමඟි පෙරමුණු රජය නව අධ්‍යාපනික ප්‍රතිපත්තීන් හඳුන්වාදීම සඳහා යොමු කළ සමාජ දේශපාලනික සන්ධර්භය පිළිබඳ පරීක්ෂා කිරීමට බලාපොරොත්තු වේ.

ඒ වගේම යථෝක්ත අධ්‍යාපනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදි ද්‍රවිඩ සිංහල ජනකොටස් සම්බන්ධව ඇති වූ වෙනස්කම් පරීක්ෂා කිරීමට ද බලාපොරොත්තු වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදුකිරීමේදී ප්‍රධාන වශයෙන් ප්‍රාථමික සහ ද්විතීය මූලාශ්‍ර අධ්‍යයනය කිරීම සිදු කෙරේ. ප්‍රාථමික මූලාශ පිළිබඳ සලකා බැලීමේදී සමකාලීන පුවත්පත්, හැන්සාඩ් වාර්තා ආදිය

පිළිබඳ ව අවධානය යොමු කෙරේ. ද්විතීය මූලාශ්‍ර පිළිබඳව සලකා බැලීමේදී මෙකී ක්ෂේත්‍රය පිළිබඳව විවිධ විද්‍යාර්ථීන් විසින් ලියන ලද පොත් පත් හා ලිපි ලේඛන පිළිබඳ අවධානය යොමු කෙරේ. ඒ වගේම අන්තර්ජාලය ඔස්සේ කරුණු සෙවීම සිදුකිරීමට ද අපේක්ෂා කෙරේ. අවසාන වශයෙන් යථෝක්ත මූලාශ්‍ර ඔස්සේ ලබාගත් කරුණු ගැඹුරු ඓතිහාසික විශ්ලේෂණයකට යොමුකර සමාලෝචනයක් සිදු කෙරේ.

## සමාලෝචනය හා නිගමන

70 දශකයේ හඳුන්වා දෙනු ලැබූ අධ්‍යාපනික ප්‍රතිපත්ති තුළින් සමස්තයක් වශයෙන් විශ්වවිද්‍යාල තුළ ද්‍රවිඩ නියෝජනය පහළ වැටුණ බව පෙනී යයි. 1969 - 1970 කාල පරාසයේ 11% ක් වූ ද්‍රවිඩයන් විශ්වවිද්‍යාල තුළ වෛද්‍ය ඉංජිනේරු පීඨ තුළ 50% ක ප්‍රමාණයක් නියෝජනය කරනු ලැබීය. නමුත් යථෝක්ත අධ්‍යාපනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම ආරම්භ වීමත් සමග විශ්වවිද්‍යාල තුළ විද්‍යා පීඨයන්හි සමස්ත ද්‍රවිඩ නියෝජනය පහළ ගියේ ය. දිස්ත්‍රික් පදනමින් බැලූ විට යාපනයේ ද්‍රවිඩ නියෝජනය බෙහෙවින් පහළ ගියේය. අනික් අතට ඊට සමගාමීව මෙම ප්‍රතිපත්ති හරහා බහුතර සිංහල නියෝජනය කැපී පෙනෙන අයුරින් ඉහළ ගියේ ය.

කෙසේ වෙතත් මෙම ප්‍රධාන ජනවර්ග දෙකෙහි ජන අනුපාතයන් හා සංසන්දනය කර බැලීමේදී සංයෝක්ත ප්‍රතිපත්තීන් හරහා ඔවුන් විශ්වවිද්‍යාල තුළ ලබා ඇති නියෝජනයන්හි දෝශයක් නැති බව පෙනී යයි. මහ ජාතිය වූ සිංහලයින් විශ්වවිද්‍යාල තුළ බහුතර නියෝජනයක් පෙන්නුම් කිරීම ස්වභාවිකය. අධ්‍යාපනයේ විවෘත තරගයක් තුළ එය අනිවාර්යයෙන්ම සිදුවන්නකි.

නමුත් යටත් විජිත අවධියේ පටන්ම විශ්වවිද්‍යාල තුළ ද්‍රවිඩයන් ලැබූ වරප්‍රසාදිත නියෝජනයම ඔවුන් තවදුරටත් බලාපොරොත්තු විය. විශේෂයෙන්ම මෙහිදී යාපනයේ වෙල්ලාල වංශිකයන්ගේ විරෝධතාව කැපී පෙනුණි. යටත් විජිත අවධියේ පටන්ම ද්‍රවිඩයන් අතරින් වැඩි වරප්‍රසාද බුක්ති වින්දේ ඔවුන් ය. ද්‍රවිඩ වෙල්ලාල වංශිකයින් සිංහලයින් යනු මෙරට මහජාතිය බව පිළිගැනීමට මැලි විය. ඔවුන් මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිංහල ආණ්ඩු විසින් ද්‍රවිඩ සුලුතරයට එල්ල කළ දැවැන්ත පහරක් වශයෙන් හුවා දක්වනු ලැබීය. සිංහලයින් හා සමාන නියෝජනයක් ඔවුන් විශ්වවිද්‍යාල තුළ බලාපොරොත්තු විය. ද්‍රවිඩ සමාජයේ කුලීන අය හා සමාන සමාජ ආර්ථික අයිතිවාසිකම් කුලහීන කණ්ඩායම්වලට අතීතයේ පටන්ම හිමිව නොතිබුණි. එම නිසා ඔවුහු වංශවතුන්ගේ පීඩාවන්ට මුල සිටම බඳුන් වූහ. 70 දශකයේ සටන්කාමීව පෙරට එන ද්‍රවිඩ තරුණයින් බොහොමයක් කුලහීන ජනකොටස්වලින් පැවත එන්නන් ය. ඔවුන් මුල සිටම සිටියේ අසහනකාරී වාතාවරණයක් යටතේ ය . ඒ අතරට අධ්‍යාපනික ප්‍රතිපත්ති හරහා සිංහල පාලකයින් තමන්ව අවතක්සේරුවට ලක්කර ඇති බව වෙල්ලාල වංශිකයින් පුන පුනා පෙන්වා දෙනු ලැබීය. එකී අදහස්වල බලපෑමට යාපනයේ තරුණයින් බඳුන් විය. ඇත්ත වශයෙන්ම අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පහර වැදුනේ ද්‍රවිඩ සමාජයේ වෙල්ලාල වංශිකයින් බුක්ති විඳි සුවිශේෂ වරප්‍රසාදවලටයි. සමකාලීන ලංකාවේ පැවති ආර්ථික අර්බුදයත් සමග සමස්ත තරුණ

ප්‍රජාවම අසහනයට පත්විය. ද්‍රවිඩ තරුණයින්ටද එම පීඩාව එකසේ දැනුනි. මේ නිසා ඔවුන් කල්පනා කළේ සාම්ප්‍රදායික ද්‍රවිඩ නායකයින්ගේ පෙන්වා දීම් වලටද අනුගතව තමන්ගේ සියලුම ගැටලුවලට හේතුව සිංහල රාජ්‍ය ප්‍රතිපත්ති බවයි. මේ නිසා ඊට එරෙහිව ඔවුහු ප්‍රචණ්ඩත්වය වපුරන්නට වූහ.

නමුත් යථෝක්ත අධ්‍යාපනික ප්‍රතිපත්ති හරහා ද්‍රවිඩ නායකයින් පෙන්වා නොදුන්නත් සුළු ජාතික නියෝජනය ඉහළ ගිය අවස්ථා ද පෙන්වා දිය හැකි ය. උදාහරණ වශයෙන් විශ්වවිද්‍යාලවල මුස්ලිම් නියෝජනය මෙම ප්‍රතිපත්ති හරහා ඉහළ ගියේය. අනිත් අතට නැගෙනහිර පළාතේ හා කඳුරට ද්‍රවිඩයන්ට විශේෂ වරප්‍රසාද ලැබුණි. කොළඹ දිස්ත්‍රික්යේ ජීවත් වූ ද්‍රවිඩයන් සිංහලයින් හා කෙරෙනු විවෘත තරගයෙන් පසුව ඔවුන්ව අභිබවා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වී තිබුණි. ඒ වගේම නිදහසින් පසුව ව්‍යාප්ත වූ නිදහස් අධ්‍යාපනික ප්‍රතිපත්ති හරහා ඒවායේ ප්‍රතිලාභ කුල භේදයකින් තොරව සමස්ත ද්‍රවිඩ සමාජයටම ලැබුණි. නමුත් යථෝක්ත අධ්‍යාපනික ප්‍රතිපත්තිවලදී ද්‍රවිඩයින්ට විවෘත තරගයකට අවතීර්ණ වීමට සිදුවීම නිසා ඔවුන්ගේ නියෝජනය සමස්තයක වශයෙන් පහළ ගියේ ය. එයිනුත් අඩු වරප්‍රසාදිත කුලහීන තරුණයින්ගේ නියෝජනය තවත් පහළට වැටුණි. එම නිසා ද්‍රවිඩ තරුණයින් මෙම ප්‍රතිපත්තිවලට එරෙහිව සටන් මගට අවතීර්ණ විය.

## මූලාශ්‍ර


1. Bandarage, Asoka (2009), The Separatist Conflict in Sri Lanka, Terrorism, Ethnicity, Political Economy, New York.
2. Jaysuriya, D.L. (1965) Developments in University Education; The Growth of the University of Ceylon, University of Ceylon Review.
3. Silva C.R. (1978), The Politics of University Admissions : A Review of Some Aspects of the Admission Policy in Sri Lanka, 1971-1978, Sri Lanka Journal of Social Science.
4. Swamy M.R.N. (2003) Inside on Elusive Mind, Prabhakaran, Colombo.
5. Wilson A.J. (1994), S.J.V. Chelvanayakam and the Crisis of Sri Lankan Tamil Nationalism 1947-1977, Colombo